## 1.28 ලාංකේය පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍යයේ බයිබලීය අන්තර්ගතය, ආකෘති හා භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් .

පී. විජිත් රොහාන් ප්‍රනාන්දු
බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

පූර්වෝක්ත පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය උදෙසා පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය සිංහල පිටපත් නවයක් භාවිත කොට තිබේ.

1. බොරලැස්ස පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1923
2. දූව පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1939
3. 'පරම පූද' පාස්කු -දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1941
4. පිටිපන පාස්කු නාට්‍ය පිටපත - 1929
5. පිටිපන පාස්කු නාට්‍ය පිටපත - 1933
6. පිටිපන පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1965
7. පිටිපන පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1979
8. පිටිපන පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1997
9. මග්ගොන - (දියලගොඩ) පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය පිටපත - 1971

මෙම නාට්‍ය පිටපත්වල බයිබලීය අන්තර්ගතය, ආකෘති හා භාවිතය පිළිබඳ පුළුල් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අභිමතාර්ථය විය.

උක්ත නාට්‍ය පිටපත් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී හමු වූ ප්‍රධාන පර්යේෂණ ගැටලුව නම් මෙම නාට්‍ය රචකයන් තම පිටපත් නිර්මාණයේ දී නික්මයාම ග්‍රන්ථයෙහි සඳහන් වන පාස්කුව පිළිබඳ කථා පුවතින් ඌණ ආභාසයක් ලබමින් උත්පත්ති පොතේ මැවීමේ කථාව පුළුල්ව පදනම් කර ගත්තේ මන් ද යන්නයි.

මෙම ගැටලුව නිරාකරණය කිරීමේ දී තහවුරු වූයේ නාට්‍ය රචකයන් අභාසය ලැබූ බයිබලීය චින්තනය ඊට බල පෑ බවයි. සාම්ප්‍රදායික දේවධර්මය මත පදනම් වූ එම බයිබලීය චින්තනය පීතෘ දේවධර්මය හා මධ්‍යකාලීන දේවධර්මයේ ප්‍රතිඵලයකි. මෙම සාම්ප්‍රදායික දේවධර්මය පාස්කුව කේන්ද්‍ර කරගත් නික්මයාම කථා පුවතට නොව මැවීම, වැටීම හා ගැලවීම පිළිබඳ දේවධර්මයට (Theology of Creation, Fall and Redemption) වැඩි නැඹුරුවක් ලබා දී තිබුණි. ඒ හේතු කොට ගෙන නික්මයාම ග්‍රන්ථයේ අඩංගු පාස්කු කථා පුවත ලාංකේය පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍යයෙන් ගිලිහී, උත්පත්ති පොතේ සඳහන් වී තිබෙන ඒදන් උයන, ආදම් - ඒව හා පාපය පිළිබඳ පුවත ඉස්මතු වූ බව මෙම පර්යේෂණයෙන් නිර්ණය කළ හැකි විය.

යුරෝපීය පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍ය කලාවේ ආරම්භය ලෙස සැලකෙන මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය (ක්‍රි.ව.10-16) ප්‍රභේදයන් වන ප්‍රාතිහාර්ය නාට්‍ය (Miracle Plays), අභිරහස් නාට්‍ය (Mystery Plays) පමණක් නොව ජර්මනියේ 'ඕබෙර් අමෙර්ගෝ' (Oberammergau) යන පාස්කු - දුඃඛප්‍රාප්ති නාට්‍යයේ ද බයිබලීය චින්තනය සාම්ප්‍රදායික දේවධර්මය මත පදනම් වූ බව මෙම පර්යේෂණයෙන් සාධනය කර ගැනීමට හැකි විය.